# වම

පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ මධ්‍යම පුවත්පත

09 කාණ්ඩය 01 කලාපය

2023 ජනවාරි

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. ආධාරය රු.70.00


## අරගලයේ මාවත අත්නොහැර මැතිවරණවලට ඉදිරිපත් වෙනවා!

### පෙරටුගාමී සමාජවාදී පක්ෂය

අරගලයේ මාවත අත්නොහැර ඉදිරියේදී පැවැත්වෙන ඕනෑම මැතිවරණයකට තම පක්ෂය ඉදිරිපත් වන බව පෙරටුගාමී සමාජවාදී පක්ෂය පවසයි.

අරගලයේදී ජනතාවගෙන් ප්‍රකාශිත දේශපාලන අභිලාෂයන් අවම වශයෙන් හෝ ඉටු කෙරෙන අයුරින් මැතිවරණ පවත්වන්නේ නම් 'ජනතාවාදී නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සඳහා වූ ජනමත විචාරණයක්' සමග මහ මැතිවරණය ප්‍රථමයෙන් පැවැත්විය යුතු බව පෙරටුගාමී සමාජවාදී පක්ෂය අවධාරණය කරයි. එසේ නොවන වෙනත් අයුරකින් පවත්වන මැතිවරණ අරගලයේ දේශපාලන අභිලාෂයන් දුර්වල කිරීමේ කුට අරමුණක් සහිතව පවත්වනු ලබන මැතිවරණයක් ලෙස ජනතාව විසින් හඳුනාගත යුතු බව ද පෙරටුගාමී සමාජවාදී පක්ෂය පවසයි.

ජන අරගලය දියකර හැරීමේ උපක්‍රමයක් ලෙස මැතිවරණ පැවැත්වීම මෙන්ම මැතිවරණ කල් දමා ගොඩනගාගන්නා ඒකාධිපති බලය යොදාගෙන අරගලය මර්දනය කිරීමේ උපක්‍රමයක් ද මේ මොහොතේ ක්‍රියාත්මක වෙමින් පවතී. විශේෂයෙන් මෙම උපක්‍රම සම්බන්ධයෙන් ආණ්ඩුව තුළ උභතෝකෝටික යක් පවතින බව පෙරටුගාමී සමාජවාදී පක්ෂය පෙන්වාදෙයි. පළාත්පාලන මැතිවරණය නියමිත දිනට පවත්වන්නේ ද නැද්ද යන්න පිළිබඳව විශේෂයෙන් මෙම පරස්පරතාව ආණ්ඩුව තුළ දක්නට ලැබේ. මේ නිසා ☞ 02 පිටුවට

## සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත රැසක් වැසී ගිහින්

# තවත් පුපුරා යාමක් ආසන්නයි!

**බැංකු ණය පොලී අනුපාත විශාල ලෙස ඉහළ දැමීම, පවතින ආර්ථික අර්බුදයේ හේතුවෙන් ණය හා ලීසින් වාරික ගෙවාගත නොහැකි අය සඳහා සඳහා සහන කාලයක් ලබා නොදීම, කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයන සීමා නිසා මිල ඉහළ යාම, විදුලි බිල ඉහළ දැමීම, ඇතුළු හේතු රාශියක් නිසා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ කර්මාන්ත මහා පරිමාණයෙන් වැසී ගොස් ඇතැයි වාර්තා වේ. මේ අතර තවත් වතාවක් විදුලි බිල 70% කින් ඉහළ දැමීමට ආණ්ඩුව ක්‍රියා කරමින් සිටින අතර එසේ වුවහොත් තවත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ කර්මාන්ත 20,000ක් පමණ එකවර වැසී යනු ඇතැයි ගණන් බලා තිබේ.**

ලංකාවේ ජාතික නිෂ්පාදනයට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ කර්මාන්ත විසින් විශාල දායකත්වයක් සපයන බැවින් ඒවා අකර්මණ්‍ය වීම තුළ සමස්ත ආර්ථිකයට සිදුවන කම්පනය හේතුවෙන් ආර්ථික අර්බුදයේ තවත් පුපුරා යාමක් නුදුරේදීම අපේක්ෂා කළ හැකි බව ආර්ථික විශ්ලේෂකයන් පෙන්වා දෙයි.

මෙසේ වැසීගොස් ඇති ව්‍යාපාර අතර විවිධ ගණයට අයත් කර්මාන්ත රැසක් ද වේ. ආනයන සීමා කිරීම හේතුවෙන් අමුද්‍රව්‍ය සපයා ගැනීමට නොහැකි වීම සහ ඒවායේ මිල ඉහළ යාම ඒ සඳහා බලපා තිබේ. ආහාර ☞ 02 පිටුවට



වසර කිහිපයක් මෙරට පාලකයන් ආර්ථික තලයේ ගත් අදූරදර්ශී තීරණ මෙන්ම දසක ගණනාවක් අනුගමනය කළ වැරදි දේශපාලන හා ආර්ථික ක්‍රමයක අනිවාර්ය ප්‍රතිඵලය ලෙස වර්ධනය වූ ණය උගුලේ හා විදේශ විනිමය අර්බුදයෙන් බැටකමින් ජනතාව 2022 වසර පුරා ගෙන ගිය අරගලය රාජ්‍ය මර්දනය හමුවේ යම් පසුබැසීමක පවතී.

එසේවුවද මේ වනවිට විවිධ දුෂ්කරතා හමුවේ ජනතාව නැවත වීදි බැස විරෝධය හා කෝපය පළ කිරීමේ අඩුවක් නැත. මේ සේයාරුවෙන් දැක්වෙන්නේ සතිපතා සාමාන්‍ය ජනයාගේ සහභාගිත්වයෙන් කොළඹ නගරය ආශ්‍රිතව පැවැත්වෙන එවැනි විරෝධතා අතර නුගේගොඩ නගරයේ පැවැත්වෙන විරෝධතාවයේ අවස්ථාවකි.

## මර්දනය, ආර්ථික පීඩනය හමුවේ දණ ගහන්න එපා!

## සංවිධානාත්මකව පාරට බහින්න.

### ශිෂ්‍ය ව්‍යාපාරයෙන් ජනතාවට පණිවිඩයක්

ආණ්ඩුවේ මර්දනය සහ ආර්ථික පීඩනය ඉදිරියේ දණ නොනමා සංවිධානාත්මකව පාරට බහින ලෙස ශිෂ්‍ය ව්‍යාපාරය ජනතාවගෙන් ඉල්ලා සිටී. ඒ සඳහා ශිෂ්‍ය ව්‍යාපාරය ලෙස ඕනෑම කැපකිරීමක් කිරීමට සූදානමින් සිටින බවද අවධාරණය කරමින් අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු වසන්ත මුදලිගේ සහෝදරයා බන්ධනාගාරයේ සිට ජනතාව වෙත විවෘත ලිපියක් යොමු කරමින් මේ බව පවසා ඇත. එම ලිපියේ තවදුරටත් මෙසේ සඳහන් වේ.

"බිත්තියේ කැලැන්ඩරය ☞ 02 පිටුවට

## සැමරුම් රැවටිලි එපා! අයිතීන් දියව්!!

### වතු කම්කරු මධ්‍යස්ථානයෙන් උද්ඝෝෂණ මාලාවක්

වතු ජනතාව මෙරටට රැගෙනවිත් වසර 200 සම්පූර්ණවීම අළලා 'සැමරුම් උත්සව' වෙනුවට ඔවුන්ට හිමි අයිතිවාසිකම් ලබා දෙන ලෙස උද්ඝෝෂණ මාලාවක් පැවැත්වීමට වතු කම්කරු මධ්‍යස්ථානය සැලසුම්කර ඇත.

එළඹෙන මාර්තු මාසය වන විට වතු ජනතාව මෙරට පදිංචියට පැමිණ වසර දෙසීයක් සපිරෙන අතර ලබන පෙබරවාරි 4 දිනට ලංකාවට ඊනියා නිදහස ලබා වසර 75 ක් සපිරෙයි. මේ නිමිති කොට ගෙන විවිධ උත්සව සහ සැණකෙළි

## විශේෂ උපාධිධාරීන් 144ක් රාජ්‍ය සේවයේ සුළු රැකියාවල

විශේෂ උපාධිධාරීන් 144ක් රාජ්‍ය සේවයේ සුළු රැකියාවල නිරත ව සිටින බව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය කරන ලද සමීක්ෂණයකින් හෙළිදරව් වී තිබේ. මෙම 144 දෙනා සුළු රැකියා සඳහා මෙලෙස රාජ්‍ය සේවයට එක්ව ඇත්තේ තම විශේෂ උපාධිය ලබා ගැනීමෙන් පසුව බව ද මෙහිදී අනාවරණය වී තිබේ. මේ අතර තම විශේෂවේදී උපාධිය සම්පූර්ණ කිරීමට ප්‍රථමයෙන් රාජ්‍ය සේවයේ සුළු රැකියාවලට එක් වූ තවත් 230 ක් ද ඉහත 144 දෙනාට අමතරව රාජ්‍ය සේවයේ සුළු රැකියාවල නිරතව සිටින බවද මෙම සමීක්ෂණයෙන් හෙළිවී තිබේ.

## සෞඛ්‍ය සේවක සංගමය මහ සමුළුව පෙබරවාරි 10 කොළඹ දී

ඒකාබද්ධ සෞඛ්‍ය සේවක සංගමයේ මහ සමුළුව පෙබරවාරි 10 පෙරවරු 10 ට කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේ දී පැවැත්වෙන බව එම සංගමයේ ප්‍රධාන ලේකම් ටැම්පිටියේ සුගතානන්ද හිමියන් පැවසූහ.

උද්ධමන හා ප්‍රවාහන දීමනාවක් ලබා ගැනීම, ඖෂධ හිඟයට වහා විසඳුම් ලබා ගැනීම, සහ රජයේ රෝහල්වල ගෙවන වාට්ටු පිහිටුවා නිදහස් සෞඛ්‍ය සේවය පෞද්ගලීකරණය කිරීමේ ආණ්ඩුවේ වැඩපිළිවෙළ පරාජය කිරීම, යන කරුණු මුල් කරගෙන සෞඛ්‍ය සේවකයින් විසින් මේ වන විටත් උද්ඝෝෂණ ව්‍යාපාරයක් ආරම්භ කර ඇත.

ඉදිරියේ පවත්වන මෙම මහා සමුළුව එම අරගලය ශක්තිමත්ව පෙරට ගැනීම සඳහා ඉවහල් වනු ඇතැයි මේ පිළිබඳව අදහස් දක්වමින් ටැම්පිටියේ සුගතානන්ද හිමි 'වම' වෙත පැවසූහ.